කරෙයිනගර් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 07 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින සභාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා ව මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ ඌනතා

i. මූල්‍ය ප්‍රකාශන වල නිරීක්ෂණය වූ ඌනතා වත්කම්, බැරකම් සහ වියදම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | බැරකම් | | වියදම | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම රු. | අවස්ථා ගණන | වටිනාකම රු. | අවස්ථා ගණන | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 129,000 | - | - | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 450 | 01 | 13,590 |
| වර්ගීකරණ දෝෂ | 01 | 1,450 | - | - | - | - |

ii. සභාවට අයත් වාහන 4 ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශ වලට ගෙන නොමැති බැවින් එම වටිනාකම් අඩුවෙන් දැක්විණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

විගණනයට අවශ්‍ය සාක්ෂි නොමැතිකම නිසා රු.129,000 කට අදාල ගණුදෙණු විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත වූ බදු පනත | - | මෙම වාර්තාවේ දින දක්වාම සමාලෝචිත වර්ෂය තුලදි අයකළ රු.178,344 ක් වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ පනත | - | මෙම වාර්තාවේ දින දක්වාම වර්ෂය තුලදි අයකළ රු.3,590 ක් වූ ජාතිය ගොඩනැගිමේ බදු මුදල දේශිය ආදායම දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| 1988 ප්‍රාදේශිය සභා ( මුල්‍ය හා පරිපාලන) රීති | | |
| පරිච්ජේදය 111 වගන්තිය 04 | - | 2006 වර්ෂයේ සභා ආරම්භයේ පටන්ම තක්සේරු බදු ලේඛනය පවත්වා නොතිබුණි. |

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.540,614 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.566,913 ක් විය.

2.2 මුල්‍ය පාලනය

-------------------

අයවැයගත ආදාය හා තත්‍ය ආදායම අතර රු.82,095 ක් වූ වෙනසක් ද අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.1,968,553 ක් වූ වෙනසක් ද විගණනයේදි නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය
-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම
-----------------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ හිටි ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2013 ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 30 | 64 | - |
| (ii) බදු කුලී | 267 | 269 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,783 | 1,743 | - |
| (iv) වෙනත් ආදායම් | 12,780 | 12,866 | 3,938 |

2.3.2 උසාවි දඩ මුදල්
---------------------

2012 සහ 2013 වර්ෂ සඳහා කයිට්ස් මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු රු.604,742 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු
-------------------

2012 හා 2013 වර්ෂ සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.2,871,905 ක් වූ මුද්දර ගාස්තු ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. මෙම වාර්තාවේ දින වන තුරුත් එම මුදල් ලැබී නොතිබුණි.

2.3.4 ආදායම් නොලැබීම
----------------------

2006 වර්ෂයේ සභා ආරම්භයේ පටන්ම වරිපනම් හා බදු අයකර නොතිබුණි. තවද සභා බල ප්‍රදේශය තුල වූ ඉඩම් හා ගොඩනැගිලි වල වරිපනම් හා බදු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර නොතිබුණි.

2.4 වත්කම් කළමණාකරණය
--------------------------------

2.4.1 වාහන උපයෝජනය
--------------------------

සභාවට අයත් සීසෑම් යන්ත්‍ර 3 ක් නිෂ්ක්‍රියව පැවතිනි.

2.4.2 සභාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම
--------------------------------------------------

2008 වර්ෂයේ සභාවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අත්තිවාරම් දැමීම සඳහා රු.2,019,602 ක මුදලක් වැයකර තිබුණි. එනමුත් ගොඩනැගිල්ල ඉදිකර නොතිබු අතර මෙය අක්‍රිය වත්කමක් බවට පත්ව තිබුණි.

2.4.3 සභාවට අයත් යතුරු ලියනයක්, මොනිටරයක් සහ ප්‍රින්ටරයක් හානියට පත්ව අවුරුදු 2 කට අධික කාලයක් තුල ගබඩාවේ තබා තිබුණි.

2.4.4 භාවිතයට නොගත් විදුලි බුබුළු
------------------------------------

සමලෝචිත වර්ෂය අවසානයේදි මිලට ගත් පිරිවැය රු.129,000 ක් වු විදුලි බුබුළු පනහක් තොග ලේඛණයේ සටහන් නොකර ගබඩාවේ තබා තිබුණි.

2.4.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------------

රු.2,928,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදි ප්‍රාග්ධන සංවර්ධන සංචිත යටතේ ඇතුලත් කර තිබුණි. ඉදිරි සංවර්ධන කටයුතු සඳහා මෙය ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර නොතිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------------

මුළුමනින්ම අත්හැර දැමු ව්‍යාපෘති
----------------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත රු.250,000 ක් වු ප්‍රාග්ධන ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

2.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-------------------------------------

සභා බල ප්‍රදේශය තුල රැස්කළ අපද්‍රව්‍ය ගිනි තබා විනාශ කර තිබුණි. එනමුත් කොම්පෝස්ට් පොහොර නිපදවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරීම
(ආ) වාහන උපයෝජනය
(ඇ) අයවැය